# ථෙරවාද විනය පිටකයේ සුදුළූණු වැළඳීම සම්බන්ධව පැනෙන විනය නීති පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඕපාත සමිත හිමි[1]

## හැඳින්වීම

ලොව පුරා ගුණවත් ආහාරයක් ලෙස ජනප්‍රිය සුදුළූණු විටෙක ගුණයෙන් අනූන ඖෂධයක් වශයෙන් ද තවත් විටෙක සුප් ව්‍යඤ්ජන රසවත් කරන අතිරේක කුළුබඩුවක් ලෙස ද යොදා ගනී. කුළුබඩු අතර ප්‍රධාන වන සුදුළූණු ඉතාම රසවත් ආහාරයකි. ඖෂධයක් වශයෙන් සලකා බැලීමේදී සුදුළූණු සිරුරේ වර්ණවත් බව වර්ධනය කරයි. දීප්තිය වඩවයි. එමෙන් ම, මතක ශක්තිය වඩවයි. අස්ථි රෝග සඳහා වඩාත් ගුණදායක සුදුළූණු සම මතුපිට ඇතිවන විවිධ ආසාත්මිකතා දුරු කරයි. ශරීරයේ ප්‍රති ඔක්සිකාරකයක් (antioxidants) ලෙස ද ක්‍රියාත්මක වේ. සිංහල භාෂා ව්‍යවහාරයේදී සුදුළූණු සඳහා 'ලූහුණු' 'හෙළ ලූහුණු' 'හෙල් බිජු' 'සුදුළූණු' යන නාමයන් ප්‍රචලිත ය. ලූහුණු යන ශබ්දය සංස්කෘත භාෂාවේ පැනෙන **'ලශුන'** යන ශබ්දයෙන් බිඳී එන ලද්දකි. සියලු රෝග සිඳ බිඳලන හෙයින් ලශුන යන නාමයෙන් හැඳින්වේ. ආයුර්වේද සාහිත්‍යයේදී මේ සඳහා රසෝන යන වචනය යෙදෙන්නේ එක් රසයක් එහි අඩු නිසා ය. සුදු ළූණු **Allum Sativam linm, Porrum sativam, Allium Ophiscorodn** යන උද්භිත නාමයන්ගෙන් හඳුන්වයි. ඉංග්‍රීසි භාෂාවේදී **Garlic** යන්න ඒ සඳහා යෙදෙයි. සකු බසින් **අරිෂ්ක, දීර්ඝපත්‍රක,** රසෝනා, වමාරි ලෙස ද පාලි බසින් **'ලසුන'** හා **'ලසුණ'** යන ව්‍යවහාර දෙකම යෙදී ඇත.

## පර්යේෂණ ගැටලුව

සුදුළූණු සම්බන්ධයෙන් ථෙරවාද විනය පිටකයේ එන විනය පැනවීම පිළිබඳ විමර්ශණාත්මක අධ්‍යයනයක යෙදීම මෙම පර්යේෂණයේ අරමුණ යි.

## පර්යේෂණ විධික්‍රමය

සුදුළූණු වැළඳීම සම්බන්ධයෙන් ථෙරවාද විනය පිටකයෙහි පැනෙන විනය පැනවීම යන නයින් සම්පාදිත මෙම අධ්‍යයනයේ දී 'පර්යේෂණ ග්‍රන්ථ පරීක්ෂණ ක්‍රමවේදය' භාවිත කෙරිණ. එහිදී ථේරවාද විනය පිටකය හා තදන්‍ය අටුවා ප්‍රාථමික

[1] උපාධි අපේක්ෂක, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
opathasamithathero@gmail.com

මූලාශ්‍රය ලෙසත්, මේ පිළිබඳ වියතුන් විසින් සපයා ඇති පොත පත සඟරා ආදිය ද්විතියික මූලාශ්‍රය ලෙසත් ආශ්‍රය කෙරිණ.

**සාකච්ඡාව**

**සුදුළූණු සම්බන්ධව බ්‍රාහ්මණ හා ත්‍රිපිටකාගත තොරතුරු**

සුදුළූණු පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී එහි සම්භවය හා සම්බන්ධ වැදගත් තොරතුරු රැසක් වේද සාහිත්‍යයෙන් අනාවරණය වේ. වේද සාහිත්‍යයේදී **රක්ෂෝඝ්න** ද්‍රව්‍යයන් අතර යොදා ගන්නා එක් ද්‍රව්‍යයකි සුදුළූණු . චරක, සුශ්‍රැත, අෂ්ඨාංගහෘදය හා කාශ්‍යප යන සංහිතාවල සුදුළූණු පිළිබඳ, හා එහි සම්භවය පිළිබඳ බොහෝ කරුණු සංගෘහිත ය. හෙළ සාහිත්‍ය අධ්‍යයනය කිරීමෙන් ද, රෝග සුව කිරීම සඳහා ඖෂධයක් ලෙස සුදුළූණු භාරතය පුරා ප්‍රචලිතව පැවති බවට බොහෝ කරුණු හමු වේ. ථේරිය සූත්‍ර දේශනාවල පැනෙන විස්තර අධ්‍යයනය කිරීමෙන් තත් කාලය වන විට භික්ෂු භික්ෂුණීන් අතර සුදු ළූණු ජනප්‍රිය ආහාරයක්ව පැවති බවට කරුණු සොයා ගත හැකි ය. ථෙරවාදී විනය පිටකටය අනුව බුද්ධ කාලයේ ජීවත් වූ භික්ෂු භික්ෂුණීන් අතර උද්ගත වූ යම් යම් විනය ගැටලු හේතුවෙන් සුදුළූණු අකැප ආහාරයක් ලෙස විනය නීති පැනවීමට බුදුරදුන්ට සිදු විය. මහායාන රටවල සුදුළූණු සම්බන්ධව පවත්නාමතය මීට වඩා බොහෝ සෙයින් වෙනස් වූවකි. මහායානික භික්ෂු භික්ෂුණීන් ඖෂධයක් වශයෙන් හෝ සුදුළූණු මිශ්‍ර කොට සාදන ලද සූප් වර්ග, ව්‍යඤ්ජන වර්ග වැළඳීමෙන් සපුරා වැළකී සිටිති.

පාලි විනය පිටකයට අයත් භික්ඛුණී විභංගයේ පාචිත්තිය පාලියෙහි මුලින්ම **'ලසුන'** යන වචනය හමු වේ. මීට අමතරව චුල්ලවග්ග පාලියේ ඛුද්දක වත්ථුක්ඛන්ධකයේදී ද ඛුද්දක නිකායේ අපදාන පාලියේ මෙන්ම විමාන වත්ථුවේ දී ද 'ලසුන' යන්න යෙදී ඇත. මෙකී ලසුන යන ව්‍යවහාරය පෙළ දහමේ සුදුළූණු සඳහා ම යොදන ලද වචනයක් බව කාරණා අධ්‍යයනය කිරීමෙන් හඳුනාගත හැකි ය. එනම් ලසුන වශයෙන් ව්‍යවහාර වන ළූණු පොකුරු වශයෙන් එකට බැඳී ඇති බව පාචිත්තිය පාලියේ ලසුන වග්ගයේ **''යාසං අය්‍යානං ලසුනෙන අත්ථො අහං ලසුනෙනාති........ ඒකෙකාය භික්ඛුණියා ද්වෙ තායෝ භණ්ඩිකේ දෙහිති''** ලෙස සඳහන් වී තිබීම. අනෙක් කරුණ නම් සුදුළූණු අනුභව කිරීම හේතුවෙන් මුඛයේ දූර්ගන්ධයන් වහනය වන බව චුල්ලවග්ග පාලියේ **''එතෙන භන්තෙ භික්ඛුනා ලසුනං ඛායිතං සො මා භික්ඛූ ව්‍යාබාධියිංසුති එකමන්තං නිසිනනෝ'හි...... ''** යනුවෙන් සඳහන් වී තිබීම. සමන්තපාසාදිකා විනය අටුවාවේදී 'ලසුණ' යන්නට විශේෂණ පදයක් ලෙස 'භණ්ඩික' යන්න යොදා සුදුළූණු **''භණ්ඩිකලසුණ''** ලෙස

හඳුන්වයි. තත් අටුවාවේ වැඩිදුරටත් විස්තර වන්නේ මේවා තනි බික් ඇති ළූණු නොවන බවයි.

**සුදුළූණු වැළඳීම සම්බන්ධව ථේරීය විනය ශික්‍ෂා පද**

බුදුරජාණන් වහන්සේ කාරණා කිහිපයක් පදනම් කර ගනිමින් සුදුළූණු වැළඳීම සම්බන්ධව භික්‍ෂූන් වහන්සේ උදෙසා මෙන්ම භික්‍ෂුණීන් වහන්සේ විෂයෙහි ද විනය නීති පනවන ලදී. සුදු ළූණු වැළඳීම සම්බන්ධව අවස්ථා දෙකකදී බුදුරදුන් විනය නීති පනවා ඇත. පළමු අවස්ථාව නම් "**න භික්ඛවේ ලසුනං ඛාදිතබ්බං යො ඛාදෙය්‍ය ආපත්ති දුක්කටස්සා'ති**" මෙම විනය නීතිය පැනවීම සඳහා හේතු වූයේ දිනක් බුදුරජාණන් වහන්සේ භික්‍ෂු සංඝයා පිරිවරා ධර්මය දේශනා කරන අවස්ථාවේදී එක්තරා භික්‍ෂූන් වහන්සේ නමක් සුදුළූණු වැළඳීම නිසා අන්‍ය භික්‍ෂූන් වහන්සේ එම ගඳින් නෙපෙළෙත්වා යි සිතා වෙනත් ස්ථානයක වැඩ සිටියහ. මෙසේ තනිව එකත් පසෙක වැඩ හුන් එම භික්‍ෂූන් වහන්සේ දුටු බුදුරදුන් කිනම් කරුණක් නිසා උන්වහන්සේ එකත් පසෙක වැඩ සිටිත්දැයි විචාළ සේක. තත් අවස්ථාවේදී අනෙක් භික්‍ෂූන් වහන්සේ බුදුරදුන්ට දන්වා සිටියේ එම භික්‍ෂුව සුදු ළූණු වැළඳීම නිසා අනෙක් භික්‍ෂූන් එම ගඳින් නොපෙළීම උදෙසා එක් පසෙක හුන් බව ය. කරුණු විමසන ලද බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, "යම් ආහාරයක් වැළඳීම හේතුවෙන් ධර්ම කතාවන්ගෙන් වැළකී සිටීමට සිදු වේද එබඳු ආහාර අනුභව නොකළ යුතු බවයි." ඒ අනුව සුදුළූණු අනුභව නොකළ යුතු ය. යමෙක් වළඳන්නේ නම් ඔහුට දුකුළා ඇවැත් වේ යැයි ඉහතින් දක්වන ලද ශික්‍ෂා පදය පැනවූ සේක.

දිනක් සැරියුත් මහරහතන් වහන්සේ මහත් උදරාබාධයකින් පෙළුණු අවස්ථාවේදී උන්වහන්සේ වෙත පැමිණි මුගලන් මහ තෙරුන් විමසා සිටියේ මීත් පෙර එම වේදනාව සුව වූයේ කුමන ඖෂධයක් හේතුවෙන් ද යන්නයි. එවිට සැරියුත් මහ තෙරුන් වදාළේ සුදුළූණු වැළඳීමෙන් උදරාබාධය දුරු වූ බවයි. මේ බව මුගලන් මහරහතන් වහන්සේ බුදුරදුන්ට දන්වා සිටීමෙන් අනතුරුව රෝගාබාධයන්ට ප්‍රත්‍ය වශයෙන් සුදුළූණු වැළඳීම අනුදැන වදාරන ලදී. (**අනුජානාමි භික්ඛවේ ආබාධපච්චයා ලසුනං ඛාදිතුං**) සුදුළූණු වැළඳීම සම්බන්ධව භික්ෂුණීන් වහන්සේලා අනුගමනය කළයුතු විනය නීති පිළිබඳව පාචිත්තිය පාළියේ භික්ඛුණී විභඞ්ගයේ ලසුන වග්ගයෙහි සඳහන් වෙයි. භික්ෂුණීන් උදෙසා සුදුළූණු වැළඳීම ඇවතක් වශයෙන් දේශනා කොට ඇත්තේ ථුල්ලනන්දා භික්ෂුණිය අරභයා ය. බුදුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන සමයේදී එක් උවසුවෙකු භික්ෂුණීන් වහන්සේලා උදෙසා සුදුළූණු පූජා කිරීමට කැමති විය.

එහෙයින් යම් භික්ෂුණියක් පැමිණි විට සුදුළූණු පොකුරු දෙකක් හෝ තුනක් ලබා දෙන ලෙසට හෙතෙම කෙත් පාලකයාට දැන්වීය. දිනක් සැවැත් නුවර යම් උත්සවයක් හේතුවෙන් ඔවුන් ගෙනවිත් තිබූ සුදුළූණු නිමා විය. භික්ෂුණිය පැමිණ සුදුළූණු අවශ්‍යතාවය ප්‍රකාශ කළ විට ගෙනෙන ලද සුදුළූණු අවසන් හෙයින් කෙත පාලනය කරන්නාගෙන් ඉල්ලා ගන්නා ලෙසට දැන්වීය. මෙහිදි කෙතට යන ලද ථුල්ලනන්දා තෙරණිය රිසි පරිදි සුදුළූණු ගෙනාහ. මෙ දැනගත් කෙත්ත පාලක භික්ෂුණිය මෙතරම් ගෙන අවායැයි දුර්ගුණ ප්‍රකාශ කරන්නට විය. මේ පිළිබඳ දැනගත් භික්ෂූන් එම කරුණ බුදුරදුන්ට සැලකළහ. බුදුරදුන් එම කරුණ පිළිබඳව තෙරණියගෙන් විමසා එහි සත්‍ය බව දැන අතීත භවයේදීත් ඇය අධික තණ්හාව හේතුවෙන් බොහෝ විපතට පත්වූ බව අතීත පුවත් සිහි කරමින් දේශනා කළහ. මෙවැනි ක්‍රියා කළාපයන් ශාසනය කෙරෙහි නොපැහැදුණ පුද්ගලයන්ගේ පැහැදීම පිණිසත්, නොපැහැදුණ පුද්ගලයන්ගේ වඩා ප්‍රසාදය පිණිසත් හේතු නොවන බව පෙන්වා දුන් සේක. එසේ දේශනා කරමින් සුදුළූණු වැළඳීම සම්බන්ධව උක්ත විනය නීතිය භික්ෂුණීන් විෂයෙහි පැනවූ සේක.

පශ්චාත් කාලීනව පිටකයන් සංස්කරණය කරණ ලද මහතෙරුන් වහන්සේලා සුදුළූණු වැළඳීමෙන් භික්ෂූණීන්ට වන ඇවැත් තව දුරටත් විවරණය කොට ඇත. එනම් ''**අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.**'' සුදුළූණු ගෙඩිය බිඳ එක් එක් බික බැගින් වළඳන්නේනම් ඒ එක් එක් බික් ගණනට පාචිත්තිය වෙයි. ''**ලසුනෙ ලසුනසඤ්ඤා ඛාදති ආපත්ති පාචිත්තියස්ස**'' සුදුළූණු සුදුළූණු බව දැන දැනම වැළඳීම පාචිත්තිය වෙයි. ''**ලසුනෙ වෙමතිකා ඛාදති ආපත්ති පාචිත්තියස්ස**'' සුදුළූණු පිළිබඳ විමතියෙන් පාචිත්තිය වෙයි. ''**ලසුනේ අලසුන සඤ්ඤා ඛාදති ආපත්ති පාචිත්තියස්ස**''සුදුළූණු සුදුළූණු යන සඤ්ඤාව නොමැතිව වළඳන්නේ ද පාචිත්තිය වෙයි. ''**ඛාදිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස**'' සුදුළූණු වළදන්නේමැයි පිළිගන්නේ ද දුකුළා ඇවැත් වෙයි. ''**අලසුනේ අලසුන සඤ්ඤා ඛාදති ආපත්ති දුක්කටස්ස**'' සුදුළූණු නොවන යමක් සුදුළූණු සඤ්ඤාවෙන් වැළදීම දුකුළා අවැත් වෙයි. ''**අලසුනේ වේමතිකා ඛාදති ආපත්ති දුක්කටස්ස**'' සුදුළූණු නොවෙන දෙයක් සුදුළූණු යැයි විමතියෙන් වළදන්නේ ද දුකුළා අවැත් වෙයි. මීට අමතරව සූප ව්‍යඤ්ජනයන්හි ද මාංස ව්‍යඤ්ජනයන්හි ද අවුල්පත් ආදියෙහි ද සුදුළූණු යොදා අහාර වර්ග ලෙස අනුභව කිරීම ඇවතක් නොවන බව දේශනා කොට ඇත.

## නිගමනය

උක්ත කරුණු අනුව ගම්‍ය වන්නේ ථෙරවාද විනය සාහිත්‍යයේ සුදුළූණු තනි ආහාරයක් වශයෙන් වැළඳීම අකැප බව ය. බුදුරදුන් මෙකී විනය නීති පනවන ලද්දේ හුදෙක් අන්තවාදී ආකල්පයන් මත පදනම්ව නොව පුද්ගලයාගේ ධර්ම ප්‍රතිපදාවට ඇතිවන බාධා වළක්වනු පිණිසත් බුදුසසුන විෂයෙහි ජන සමාජයෙන් පැන නගින ලද දෝෂ දර්ශනයන් දුරු කිරීම පිණිසත් ය. යන බව පැහැලිය. ධ්‍යාන සම්ප්‍රදායන් ගරු කරන මහායානික රටවල් සුදුළූණුවල පවතින වාජීකරන ගුණය පදනම් කරගෙන එහි භාවිතය තහණම් කොට ඇති බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : සුදුළූණු , ස්වස්ථතා , භික්ෂු භික්ෂුණී ශික්ෂාපද, ඖෂධ , ආයුර්වේදය

## ආශ්‍රිත ග්‍රන්ථ

විනය පිටකය, (2006), පාචිත්තිය පාලිය, ලසුන වග්ග, බු.ජ.ත්‍රි., ශ්‍රී ලංකාව.

රංජිත් වනරත්න (සංස්), , සමන්තපාසාදිකා විනය අටුවාව, දෙවන කොටස, හේවාවිතාරණ මුද්‍රණය.

භෂාම්, ඒ. එල්., අසිරිමත් ඉන්දියාව (තෙවන මුද්‍රණය), අධ්‍යාපන ප්‍රකාශණ දෙපාර්තමේන්තුව.

රාහුල, කොටපිටියේ (සංස්), (2016), බෞද්ධ විනය අධ්‍යයන, රජයේ මුද්‍රණාලය, ශ්‍රී ලංකාව.